**<u>මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ මධ්‍යම පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ කම්කරු , දිස්පැන්සරි කම්කරු , මධ්‍යස්ථාන භාරකරු හා පශු උපස්ථායක තනතුරු සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය</u>**

01. සම්බන්ධ වන ආයතන

| | | | |
|---|---|---|---|
| 1.1 මධ්‍යම පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | : යොමු අංකය | : CPC/APH/1/21/බ:පරි | දිනය : 2014-06-11 |
| 1.2 මධ්‍යම පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශය | : යොමු අංකය | : CPC/MA/1/7/1/7 | දිනය : 2014-06-16 |
| 1.3 මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය | : යොමු අංකය | : CPC/CS/2/3/SM/A | දිනය : 2014-06-30 |
| 1.4 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම | : යොමු අංකය | : DMS/D/පොදු/11-2 | දිනය : 2012-12-19 |
| 1.5 ජාතික වැටුප් කොමිෂන් සභාවේ නිර්දේශය | : යොමු අංකය | : NCP/10/71/4/SR | දිනය : 2014-11-10 |
| 1.6 මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය | : යොමු අංකය | : CPC/PSC/9/3/7 (I) | දිනය : 2014-11-25 |

02. පත් කිරීම් බලධරයා : මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් බලය පවරන ලද මධ්‍යම පළාත් සභාවේ සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශ ලේකම්

03. සේවා ගණය පිළිබඳ විස්තර :

3.1 සේවා ගණය : ප්‍රාථමික ශ්‍රේණිය - ශිල්පීය නොවන

3.2 ශ්‍රේණි : III , II , I හා විශේෂ

3.3 පැවරෙන කාර්යභාරය පිළිබඳ පොදු නිර්වචනය :

ආයතනයන්හි කාර්යයන් ඉටු කිරීම හා පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය වන පොදු මූලික අවශ්‍යතාවයන් අතරින් නිශ්චිත අර්ධ ශිල්පීය හෝ ශිල්පීය නිපුණතාවයකින් තොරව ඉටුකළ හැකි ප්‍රාථමික සේවා ගණයට අයත් කාර්යයන්ගෙන් සමන්විත බහු කාර්ය සේවා ගණයක් ලෙස මෙම සේවා ගණය සැලකේ. මෙම කාර්ය පථයට අයත් කාර්යයන් අතරින් ඕනෑම කාර්ය භාරයක් ආයතන හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් මෙම සේවක ගණයට පවරනු ලැබේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2014-12-02 දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම්

04. තනතුරේ ස්වභාවය : ස්ථිර විශ්‍රාම වැටුප් සහිත

05. වැටුප් :

5.1 වැටුප් කේත අංකය : PL 1 - 2006 A

5.2 වැටුප් පරිමාණය : 11,730-10 x 120-10 x 130-10 x 145-12 x 160 - 17,600/=

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර :

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු.) |
|---|---|---|
| III | 01 | 11,730.00 |
| II | 12 | 13,060.00 |
| I | 22 | 14,375.00 |
| විශේෂ | 32 | 15,840.00 |

06. නිලධර ගණයට අයත් තනතුරු :

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුරු නාමය | අනුමත ශ්‍රේණි | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| කම්කරු | III, II, I හා විශේෂ ශ්‍රේණිය | 19 | තනතුරට අදාළව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරනු ලබන කාර්යයන් |
| දිස්පැන්සරි කම්කරු | III, II, I හා විශේෂ ශ්‍රේණිය | 63 | |
| මධ්‍යස්ථාන භාරකරු | III, II, I හා විශේෂ ශ්‍රේණිය | 37 | |
| පශු උපස්ථායක | III, II, I හා විශේෂ ශ්‍රේණිය | 02 | |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව :

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යය සඳහා III, II, I හා විශේෂ ශ්‍රේණින් සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

සටහන :

ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයක් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව පදනම් කොට ඕනෑම ශ්‍රේණියක සේවකයෙකුට ආයතන ප්‍රධානියා විසින් පවරනු ලැබිය හැකිය.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2014-12-02 දින
අනුමත කරන ලදි
ආණ්ඩුකාර ලේකම්

07. බඳවා ගැනීමේ ක්‍රමය :

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන් :

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 100% |
| සීමිත | - |
| කුසලතා | - |

7.2 විවෘත බඳවා ගැනීම :

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

7.2.2 සුදුසුකම් :

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම් : අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් හයකට නොඅඩුව යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව සමත්ව තිබිය යුතුය.

7.2.2.2 වෘත්තිය සුදුසුකම් : අදාල නොවේ.

7.2.2.3 පළපුරුද්ද : අදාල නොවේ.

7.2.2.4 කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයකුම මධ්‍යම පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.2.2.5. වෙනත් :

i. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

ii මධ්‍යම පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.

iii. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

iv. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.2.3. වයස :

7.2.3.1 අවම සීමාව : අවුරුදු 18 යි.

7.2.3.2 උපරිම සීමාව : අවුරුදු 45 යි.

7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

7.2.4.1 ලිඛිත විභාගය : අදාල නොවේ.

7.2.4.2 වෘත්තිය පරීක්ෂණය : අදාල නොවේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2014-12-02 දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම්

7.2.4.3. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී සුදුසුකම් පරීක්ෂා කර බැලීමද සිදු කරනු ලැබේ.

| පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 01. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 30 | අදාළ නොවේ. |
| 02. පළපුරුද්ද (තනතුරට අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද සඳහා ලකුණු ලබා දෙනු ලැබේ.) | 50 | |
| 03. තනතුරට හිමි ක්ෂේත්‍රයේ අදාළ රජයේ පිළිගත් ආයතනයක හදාරා ඇති පාඨමාලා හා ලබා ඇති පුහුණුව | 15 | |
| 04. සම්මුඛ පරීක්ෂණයේදී පිළිබිඹු කරන ආකල්ප හා පෞරුෂය සඳහා | 05 | |

සටහන : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ඉහළම ලකුණු ලබා ගත් අයදුම්කරුවන් අතුරින් පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවා ගනු ලැබේ.

7.2.4.3.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා :

මධ්‍යම පළාත් සභාවේ සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශ ලේකම්.

7.2.5. අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීමක් මගින්

7.3 සීමිත බඳවා ගැනීම : අදාළ නොවේ.

7.4 කුසලතා මත බඳවා ගැනීම : අදාළ නොවේ.

08. කාර්යක්ෂමතා කඩඉම් :

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | III වන ශ්‍රේණියට පත්වී වසර තුනක් (03) ගත වීමට පෙර | ලිඛිත / වාචික පරීක්ෂණය ( ඇමුණුම 01) |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | II වන ශ්‍රේණියට උසස් වී වසර තුනක් (03) ගත වීමට පෙර | ලිඛිත / වාචික පරීක්ෂණය (ඇමුණුම 02) |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | I වන ශ්‍රේණියට උසස් වී වසර පහක් (05) ගත වීමට පෙර | ලිඛිත / වාචික පරීක්ෂණය ( ඇමුණුම 03) |

8.2 පරීක්ෂණය පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද : වසරකට දෙවරක්

8.3 කාර්යක්ෂමතා කඩඉම්වලට අදාළ පරීක්ෂණය පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද :

මධ්‍යම පළාත් සභාවේ සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශ ලේකම්



ගරු ආණ්ඩුකාරතුමා විසින්
2014-12-02 දින
අනුමත කරන ලදි
ආණ්ඩුකාර ලේකම්

09. රාජ්‍ය භාෂා ප්‍රවීණතාව :

| භාෂාව | ලබා ගත යුතු ප්‍රවීනතාවය |
|---|---|
| රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යකින් සේවයට බැඳුණු සේවකයින් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පරිවාස කාලය තුළ ලබා ගත යුතුය. |
| අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 අනුව අදාල මට්ටමේ (04 කාණ්ඩයේ) ප්‍රවීණතාව ලබා ගත යුතුය. |

10. ශ්‍රේණි උසස් කිරීම :

10.1 III වන ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම

10.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :

I. පත්වීම ස්ථිර කර තිබීම.

II. නිලධර ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහයක (10) ක ්‍යාක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය(10)ක් උපයාගෙන තිබීම.

III. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් වීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10)ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. උසස්වීම් දිනට පූර්වාසන්නතම වසර පහක (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

V. අදාල මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගෙන තිබීම.

VI. නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරික්ෂණය සමත් වී තිබීම.

10.1.1.1 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන සේවකයින් විසින් නියමිත ආකෘති පත්‍රය මගින් පත්වීම් බලධාරියා වෙත ඉල්ලුම් කරනු ලැබූ විට සුදුසුකම් පරික්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි තනතුරේ II ශ්‍රේණියට උසස් කිරීම පත්වීම් බලධාරියා විසින් සිදු කරනු ලැබේ.

10.2 II වන ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම.

10.2.1 සපුරාලිය යුතු සුදුසුකම් :

I. සේවා ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර නවය (09) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක නවය (09)ක් උපයාගෙන තිබීම.

II. උසස් කිරීමේ දිනට පූර්වාසන්න වසර පහක (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

III. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර නවය (09)ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරික්ෂණය සමත් වී තිබීම.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2014-12-02 දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම්

10.2.1.1 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන සේවකයින් විසින් නියමිත ආකෘති පත්‍රය මගින් පත්වීම් බලධාරියා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට පත්වීම් බලධාරියා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව I ශ්‍රේණියට උසස් කිරීම සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි පත්වීම් බලධාරියා විසින් සිදු කරනු ලැබේ.

10.3 I වන ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම

10.3.1 සපුරාලිය යුතු සුදුසුකම් :

I. සේවක ගණයේ I ශ්‍රේණියේ අවම වශයෙන් වසර නවය (09)ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක නවය (09)ක් උපයා ගෙන තබීම.

II. උසස්වීම් දිනට පූර්වාසන්නතම වසර පහක (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

III. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර නවය (09)ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත් වී තිබීම.

10.3.1.1 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන සේවකයන් විසින් නියමිත ආකෘති පත්‍රය මගින් පත්වීම් බලධාරියා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට පත්වීම් බලධාරියා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සිදු කරනු ලැබේ.

11. තනතුරු වලට පත් කිරීම : අදාළ නොවේ.

12. අර්ථ නිරූපණ හා නිර්වචන :

12.1 "ආණ්ඩුකාරතුමා" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා වේ.

12.2 "ලේකම්" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වේ.

12.3 "ප්‍රධාන ලේකම්" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාතේ ප්‍රධාන ලේකම්වරයා වේ.

12.4 "අමාත්‍යාංශ ලේකම්" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් සභාවේ සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා වේ.

12.5 "දෙපාර්තමේන්තු ප්‍රධානියා" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යක්ෂවරයා වේ.

12.6 "සතුටුදායක සේවා කාලය" යනු රජයේ නිලධාරියෙකු විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරි ඉටුකිරීම මගින්ද, සමත් විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම් නියමිත දිනට සමත්වීම මගින්ද, ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මගින්ද, එම කාලය තුළදී උපයාගතව තිබූ සියළුම වැටුප් වර්ධක උපයා ගෙන ඇත්තාවූ සහ ඔහු විසින් දඩුවම් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්දා වූ කාලසීමාවක් වන්නේය.

ගරු ආණ්ඩුකාරතුමා විසින් 2014-12-02 දින අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම්

12.7 "සක්‍රිය සේවා කාලය" යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියේ යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියළුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රිය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

13. සේවයේ යෙදී සිටින සේවකයින් නව ශ්‍රේණි ක්‍රමය සඳහා අන්තර්ග්‍රහණය කිරීම

බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාළ වේ.

නව බඳවා ගැනීම් පරිපාටිය ක්‍රියාත්මක වන දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 (iv) මගින් ලබා දී ඇති PL 1-2006 A වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන සේවකයින් සියළු දෙනාම ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 04 වගන්තියේ විධිවිධානවලට යටත්ව පහත සඳහන් පරිදි ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කරනු ලැබේ. සේවා කාලය ගණන් ගත යුත්තේ එම ශ්‍රේණියට පත් කරන ලද දිනය පදනම් කර ගෙනය. කෙසේ වුවද අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ තැනැත්තාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය. එසේම වැටුප් පරිවර්තනයේදී අදාළ තැනැත්තා අවසන්වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊළඟ පහළ වැටුප් පියවරේ තැබීමද සිදු නොකළ යුතුය.

**(i) PL 1 – III ශ්‍රේණිය**

(අ) PL 1-2006 A වැටුප් පරිමාණයෙහි III වන ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබාදී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු දහයක (10) ක සේවා කාලයක් සම්පූර්ණ කර නැති සේවකයින්

(ආ) ඉහත සඳහන් පරිදි III ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් වසර දහයක් (10) හෝ ඊට වැඩි සේවා කාලයක් සම්පූර්ණ වුවද II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීමට අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා නොමැති සේවකයින්

III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කෙරේ.

**(ii) PL 1 – II ශ්‍රේණිය**

(අ) PL 1-2006 A වැටුප් පරිමාණයෙහි III වන ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබාදී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් වසර දහය (10) හෝ ඊට වැඩි එහෙත් අවුරුදු විස්සට (20) කට අඩු සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාළ කාලය තුළ වැටුප් වර්ධක(10)ක් උපයාගෙන ඇති හා නව බඳවාගැනීමේ පරිපාටිය ක්‍රියාත්මකවීමට පෙර ක්‍රියාත්මකව පැවැති බඳවා ගැනීමේ පරිපාටිය අනුව අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති සේවකයින්

(ආ) PL 1-2006 A වැටුප් පරිමාණයෙහි II වන ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබාදී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් වසර නවය (09)ක සේවා කාලයක් සම්පූර්ණ කර නැති සේවකයින්

(ඇ) ඉහත සඳහන් පරිදි II ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක සේවා කාලය වසර නවය (09) සම්පූර්ණ වුවද නව බඳවාගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට පෙර ක්‍රියාත්මකව පැවති බඳවා ගැනීමේ පරිපාටිය අනුව I ශ්‍රේණියට උසස්වීමට අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා නොමැති සේවකයින්

II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කෙරේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2014-12-02 දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම්

**(iii) PL 1 – I ශ්‍රේණිය**

(අ) ඉහත සඳහන් පරිදි III ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් වසර විස්ස (20) ක් හෝ ඊට වැඩි එහෙත් වසර තිහ (30) කට අඩු සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාළ කාලය තුළ වැටුප් වර්ධක විස්ස(20)ක් උපයාගෙන ඇති හා නව බඳවාගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට පෙර ක්‍රියාත්මකව පැවති බඳවා ගැනීමේ පරිපාටිය අනුව අනෙකුත් අවශ්‍යතා සපුරා ඇති සේවකයින්

(ආ) ඉහත සඳහන් පරිදි II ශ්‍රේණියට අදාල තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් වසර නවය (09) ක් හෝ ඊට වැඩි එහෙත් වසර දහනවය (19) කට අඩු සේවා කාලයක් ඇති එමෙන්ම අදාල කාලය තුළ වැටුප් වර්ධක නවය (09)ක් උපයාගෙන ඇති හා ඉහත සඳහන් අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති සේවකයින්

(ඇ) PL 1-2006 A වැටුප් පරිමාණයෙහි I ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබාදී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් වසර නවයක (09) සේවා කාලයක් සම්පූර්ණ කර නැති සේවකයින්

(ඈ) ඉහත සඳහන් පරිදි I ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක සේවා කාලය වසර 09 සම්පූර්ණ වුවද විශේෂ ශ්‍රේණියට උසස්වීමට අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා නොමැති සේවකයින්

I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කෙරේ.

**(iv) PL 1 – විශේෂ ශ්‍රේණිය**

(අ) ඉහත සඳහන් පරිදි III ශ්‍රේණියට අදාල තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් වසර තිහක (30) සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාළ කාලය තුළ වැටුප් වර්ධක තිහක් (30) උපයාගෙන ඇති හා නව බඳවාගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට පෙර ක්‍රියාත්මකව පැවති බඳවාගැනීමේ පරිපාටිය අනුව අවශ්‍ය අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති සේවකයින්

(ආ) ඉහත සඳහන් පරිදි II ශ්‍රේණියට අදාල තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් වසර දහනවයක (19) සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාල කාලය තුළ වැටුප් වර්ධක දහනවයක් (19) උපයාගෙන ඇති හා ඉහත සඳහන් අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති සේවකයින්

(ඇ) ඉහත සඳහන් පරිදි I ශ්‍රේණියට අදාල තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් වසර නවයක (09) සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාල කාලය තුළ වැටුප් වර්ධක නවය(09)ක් උපයාගෙන ඇති හා ඉහත සඳහන් අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති සේවකයින්

(ඈ) PL 1-2006 A වැටුප් පරිමාණයෙහි විශේෂ ශ්‍රේණියට අදාල වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක වැටුප් ලබන සේවකයින්

විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කෙරේ.

14. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි මධ්‍යම පළාත් මූල්‍ය රීති සහ දෙපාර්තමේන්තු නියෝග සහ රජය / මධ්‍යම පළාත් සභාව විසින් කලින් කලට පනවනු ලබන නීතිරීති හා/හෝ රෙගුලාසි අදාළ වේ.

15. මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් තීරණය කරනු ලැබේ.



ගරු ආණ්ඩුකාරතුමා විසින්
2014-12-02 දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම්

**<u>මධ්‍යම පළාත් සභාවේ සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ කම්කරු, දිස්පෙන්සරි කම්කරු, මධ්‍යස්ථාන භාරකරු හා පශු උපස්ථායක තනතුරු සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය</u>**

01. විභාගයේ/පරීක්ෂණයේ නම : I වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය

02. විභාගයේ/පරීක්ෂණය පිළිබඳ විස්තර :

| ප්‍රශ්ණ පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| ආයතන රෙගුලාසි | පැය 01 | 100 | 40% |
| දෙපාර්තමේන්තු රෙගුලාසි | | | |

03. පවත්වනු ලබන බලධරයා : මධ්‍යම පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශ ලේකම්

04. විභාගය පවත්වනු ලබන කාල සීමාව : වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්ණ පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ආයතන රෙගුලාසි | I පරිච්ඡේදයේ 1.1 අර්ථ නිරූපනය පිළිබඳ දැනුම 1, 2, 3, 4,5,6 වගන්ති පිළිබඳ දැනුම<br>සාමාන්‍ය දැනුම පරීක්ෂා කෙරෙන රචනා ස්වරූපයේ පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්ණ 03 |
| දෙපාර්තමේන්තු රෙගුලාසි | <u>සාමාන්‍ය කම්කරු :-</u><br>01. සේවක පැමිණීම පිටවීම හා නිවාඩු හිමිකම පිළිබඳ කරුණු<br>02. දුරකථන භාවිතය දුරකථන ඇමතුමකට පිළිතුරු දීම සම්බන්ධව නිවැරදි ක්‍රම පිළබඳ දැනුම<br>03. මහජන සම්බන්ධතාවය මහජනයා පිළිගැනීම හා ඔවුන්ට අවශ්‍ය තොරතුරු ලබාදීම යන කරුණු සම්බන්ධ විධිමත් දැනුම<br><u>මධ්‍යස්ථාන භාරකරු :-</u><br>01. තෘණ හා රනිල ආදර්ශයක් කාර්යාල භූමියේ ඇති කර නඩත්තු කිරීම පිළිබඳ දැනුම<br>02. ආදර්ශ ඒකාබද්ධ ගොවිපලක් ඇති කර නඩත්තු කිරීම පිළිබඳ දැනුම<br>03. කාර්යාල භූමිය අලංකරණය කිරීම පිළිබඳ දැනුම<br><u>දිස්පැන්සරි කම්කරු / පශු උපස්ථායක</u> :-<br>01. දියර N 2 හා ගව ශුක්‍ර කලමනාකරණය පිළිබඳව දැනුම<br>02. ප්‍රතිකාර කිරීමේදි හා ශල්‍යකර්මයකදි සතෙකු හසුරුවා ගැනීම පිළිබඳ දැනුම<br>03. පශ්චාත් මරණ පරීක්ෂණයකදි භාවිතා කරන උපකරණ පිළිබඳව දැනුම<br>සාමාන්‍ය දැනුම පරීක්ෂා කෙරෙන රචනා ස්වරූපයේ පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්ණ 02 |



ගරු ආණ්ඩුකාරතුමා විසින්
2014-12-02 දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම්

### <u>මධ්‍යම පළාත් සභාවේ සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ කම්කරු, දිස්පෙන්සරි කම්කරු, මධ්‍යස්ථාන භාරකරු හා පශු උපස්ථායක තනතුරු සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය</u>

01. විභාගයේ/පරීක්ෂණයේ නම : II වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය

02. විභාගය/පරීක්ෂණය පිළිබඳ විස්තර :

| ප්‍රශ්ණ පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| ආයතන සංග්‍රහය<br>කාර්යාල ක්‍රම | පැය 01 | 100 | 40% |

03. පවත්වනු ලබන බලධරයා : මධ්‍යම පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශ ලේකම්

04. විභාගය පවත්වනු ලබන කාල සීමාව : වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්ණ පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ආයතන සංග්‍රහය | II පරිච්ඡේදය - 1, 7, 8, 11,12,14, 15, 16 වගන්ති<br>V පරිච්ඡේදය - 4, 6, 7 වගන්ති<br>XII පරිච්ඡේදය - 1, 2, 3, 4, 5, 6, 7, 8, 9, 18, 26 සහ 27 වගන්ති<br>(කෙටි / බහුවරණ ප්‍රශ්ණ 10) |
| කාර්යාල ක්‍රම | කාර්යාලයට ලැබෙන ලිපියක් සම්බන්ධව ගනු ලබන ක්‍රියාමාර්ග පිළිබඳ මූලික දැනුම<br>ලිපි ලේඛණ සුරක්ෂිතව නිලධාරීන්ට භාර දීම පිළිබඳ දැනුම ලිපි ගොනුවක් හඳුනා ගැනීම හා චලනය (එහා මෙහා ගෙන යාම) පිළිබඳ මූලික දැනුම<br>කාර්යාලයක භාවිත වන ලේඛණ නඩත්තුව පිළිබඳ සාමාන්‍ය දැනුම (පැමිණීමේ ලේඛණ / නිවාඩු ලේඛණ / බඩු වට්ටෝරු ලේඛණ / එළදා ලේඛණ / දුම්රිය බලපත්‍ර ලේඛණ යනාදිය) |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2014-12-02 දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම්

ඇමුණුම - 03

**මධ්‍යම පළාත් සභාවේ සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ කම්කරු, ඩිස්පෙන්සරි කම්කරු, මධ්‍යස්ථාන භාරකරු හා පශු උපස්ථායක තනතුරු සඳහා වන තුන්වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය**

01. විභාගයේ/පරීක්ෂණයේ නම : III වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය

02. විභාගය/පරීක්ෂණ පිළිබඳ විස්තර :

| ප්‍රශ්ණ පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| ආයතන සංග්‍රහය | පැය 01 | 100 | 40% |
| කාර්යාල ක්‍රම | | | |

03. පවත්වනු ලබන බලධරයා : මධ්‍යම පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශ ලේකම්

04. විභාගය පවත්වනු ලබන කාල සීමාව : වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්ණ පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ආයතන සංග්‍රහය | XIV පරිච්ඡේදය - 1, 2, 3, 4, 5 සහ 28 වගන්ති පිළිබඳ සාමාන්‍ය දැනුම<br>XVI පරිච්ඡේදය - 1, 2, 3 සහ 4 වගන්ති පිළිබඳ සාමාන්‍ය දැනුම<br>XXI පරිච්ඡේදය - 1, 2, 3 සහ 4 වගන්ති පිළිබඳ සාමාන්‍ය දැනුම<br>XXIII පරිච්ඡේදය - 1 සහ 2 වගන්ති පිළිබඳ සාමාන්‍ය දැනුම |
| මුදල් රෙගුලාසි | IV පරිච්ඡේදය - මු.රෙ. 165, මු.රෙ. 166, මු.රෙ. 168 පිළිබඳ සාමාන්‍ය දැනුම<br>V පරිච්ඡේදය - මු.රෙ. 225 පිළිබඳ සාමාන්‍ය දැනුම |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2014-12-02 දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම්

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය :- නිර්දේශ කරමි.

01. එස්.බී.බැද්දෙවෙල මහතා (සභාපති) ..................................................

02. යූ.ඒ.බෝගහපිටිය මහතා (සාමාජික) ..................................................

03. පී.පී.එස්.ඒ.දිසානායක මිය (සාමාජික) ..................................................

04. වෛත්‍යලිංගම් නන්දකුමාර් මහතා (සාමාජික) ..................................................

05. ඒ.ජේ.එම්. මොහිදීන් නිස්තාර් මහතා (සාමාජික) ..................................................

දිනය 2014-11-25

ආණ්ඩුකාර ලේකම්,

2014-11-25 දිනැති කොමිෂන් සභා වාර්තාවේ අංක 14/1610 යටතේ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ මධ්‍යම පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ කම්කරු , දිස්පැන්සරි කම්කරු , මධ්‍යස්ථාන භාරකරු හා පශු උපස්ථායක තනතුරු සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

දිනය 2014-11-27

..................................................
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
මධ්‍යම පළාත
නිල මුද්‍රාව

මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය :-

අනුමත කරමි / නොකරමි

..................................
ටිකිරි කොබ්බෑකඩුව
මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර
2014-12-02